"සතත අභ්‍යාසය හරිම වැදගත්"

කඳුළේ මතුවුණ තාත්තා චෙලෝවේ තත් පිරිමදින අතරේ කියනවා. ඒ පිරිමැදිල්ලෙන් තත් මවන්නේ අපූර්වත්වයක්. ඒ අපූර්වත්වයෙන් මැවෙන ආහ්ලාදය වයලින් සර පෙළක තනුවට මුල පුරනවා. කඳුළු අතරේ බොඳ වුණ සුදු පුතාගෙන් මතුවෙන්නේ අපේ කොළු ගැටයෙක්. හරියට අළුව අල්ලාගන්නවත් දන්නෙ නැති කොළු ගැටයෙක්. කොළු ගැටයා අතේ අර පරණ වයලීනය. වැඩිහිටියෙකුට ගැළපෙන ප්‍රමාණයේ වයලීනයේ ඇඟිලි පුවරුවට අමාරුවෙන් අත දිගහරින්න පුළුවන් මේ කොළු ගැටයාට.

"නිසග කුසලතාව..." තාත්තා තමන්ට ම හිනැහෙනවා අහක බලාගෙන. සුදෝ සුදුවට බබලන තාත්තාගේ ජාතික ඇඳුමට චෙලෝව ගැළපෙනවද මන්දා. කෙස් ගිය හිස් මුදුනත නළලට යා වෙලා. කොළු ගැටයාගේ අක් බඹරු ගෙතුන කෙහෙ රැළි ලැබෙන්න ඇත්තෙ අම්මාගෙන්. කොළුවාට පොඩි කාලෙදි ම සරම් පොඩ්ඩක් ගෙදරට අඳින්න මහලා දුන්නෙත් අම්මා. අත් නැති මේස් බැනියම නම් කඩෙන්.

"ඉගෙනගන්නෙ නැතිව බෑ. ව්‍යුත්පත්තිය..., ව්‍යුත්පත්තිය...!" තාත්තා තමන්ට ම කොඳුරාගන්නවා.

"සංගීතය...?" තාත්තා තමන්ගෙන් ම අහගන්නවා.

කැලණි ගඟට සීතාවක අතු ඔය එකතුවෙන නිම්නය හරි සාරවත්. නිතරම පිටාර ගලන හින්දා වෙන්න ඕන. හරිත වර්ණ ගහ කොළවලින් පිරුණ රක්ෂිතය වෙනකල් පැතිරුණ කුඹුරු යාය එක ම ඉපනැල්ලක් වෙලා. කුඹුරු වැඩ ඉවර හන්දා. ඒ ඉපනැල්ලේ තාත්තා හෙමිහිට මැකිලා යනවා කඳුළු අතරින් ම. ඒත් චෙලෝව? තරුණ විය අග ඉන්න කාන්තා ක්වන්ධයක හැඩ රුවැති චෙලෝව තනි වෙලා වෙල් ඉපනැල්ලෙ. කොළු ගැටයා වටපිට බලනවා. හිරිමල් යෞවනියකගේ ක්වන්ධයක නාරි රූපයෙන් පරණ වයලීනය තව ම ඔහු අත.

සුදු පිය - පුතු දෙපළගේ වාදනය ඉදිරියට ම. වසන්ත හිරු රැස් එකින් එක එකතු වෙලා පරිසරය උණුසුම් අතට. ඒත් සිසිරය





අග දළු ලන මේපල් ඉපල්වලටත් පුළුවන් හෙවනක් දෙන්න. මේපල් ගහකින් වාරුවක් ගන්න දෙපය ඉල්ලනවා. සුදු වාදකයින් දෙපළ නම් ඉන්නේ කඩමණ්ඩියේ වහල ඉදිරියට නෙරලා හැදුන 'කැනපි' හෙවනේ. එන, යන, මොහොතක් සංගීතය විඳින අය වැඩිවෙනවා වගේ. ඒත් වාදකයින්ටවත්, වාදනයටවත්, වින්දනයටවත් කාලය පියඹා යනවා ගණනක් නැති ගානයි.

වාදක දෙපළට මද ඉසිඹුවක්. තමන් ළඟ තියෙන ප්ලාස්ටික් බෝතලයේ වතුර උගුරකින් සුදු පියා තොල කට තෙමාගන්නවා. සුදු පුතා නම් බොන්නෙ 'කෝක්' එකක්. ඒ 'ටිම් ටැම්' බිස්කට් එකකුත් එක්ක. අතේ තියෙන 'කැපිචිනෝ' කෝපි කෝප්පෙ මතක් වුණේ දැන්. කෝපි එක නිවිලා. ඒකත් හොඳ. දාහය වැඩිවෙන වෙලාවට සිසිල් කෝපි...!

සුදු පිය - පුතු දෙපළ පිවිසෙනවා වාදනයට ආයෙමත්. තනුවත්, රිද්මයත් වෙනස්. ඒත් හුරු බව වැඩි වෙනවා තව තවත්. කඳුළින් බොඳවෙන සුදු රූප අතර චෙලෝවත්, වයලීනයත් රැඳිලා තවමත්. හිත පාවෙනවා ආයෙමත්. පාවෙලා යන හිත ළඟ නැවතුන මතකයේ මේ වාරෙ චෙලෝව වාදනය කරන්නේ මව්බිමේ ප්‍රවීණ සංගීතවේදියෙක්...

වයලීන් වාද්‍ය විශාරද ප්‍රවීන් රසදේව.

වයලින් පවුලේ වයලීනය, වියෝලය, චෙලෝව, බේස් වයලීනය කියන හැමෝව ම එක විදියට හඬවන්න එදා ඉඳන් ම දක්ෂයෙක්.

පරණ වයලීනය තුරුළු කරගෙන හිටපු කොළු ගැටයා දැන් හිරිමල් තරුණයෙක්. පහුගිය කාලයේ වයලීනය අල්ලන්න තරම්වත් තරුණයාට ඉස්පාසුවක් තිබුණෙ නෑ. ඒත් සුදු පුතාගේ වයලින් වාදනයට මේ තරුණයා අනුගත වෙලා. ඒ ප්‍රවීන් රසදේවයන්ගේ චෙලෝ පසුබිම් රිද්ම රටාවට අනුව.

පරණ වයලීනය විතරක් නෙවෙයි බහාලුමත් දිරාපත් වෙලා. ඉගෙනගත්ත දෙයින් ලැබුණ රස්සාවේ පඩියෙන් කීය කීය හරි